## 1.1 හැදින්වීම

පුද්ගලයාට වඩාත් යහපත් ජීවිතයක් සකසා දීම සඳහා කලාව බිහිවිය යුතුය. ගීතයද එවන් ප්‍රබල කලා මාධ්‍යයකි. වින්දනය උදෙසා ඉදිරිපත් කෙරෙන ගීත වල භාෂාව රසවත් විය යුතුය. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි නාලිකා ගීතය මුල්කර ගනිමින් සියළු වැඩසටහන් පෙළගස්වා තිබේ. SURVEY RESEARCH LANKA වාර්ථා වලට අනුව සතියක් තුල මාධ්‍ය වලට යොමු වූ මිලියන 14.3ක් වූ ග්‍රාහක සංඛ්‍යාවෙන් 76% ක් ගුවන් විදුලියට සවන් දෙති. මෙම නාලිකා වල දවසින් වැඩිම ප්‍රමාණයක් විකාශය වන්නේ ගීත වීමද විශේෂත්වයකි. මෙවන් තත්ත්වයක් තුල ගුවන් විදුලිය මගින් ශ්‍රාවකයාට ශ්‍රවණය වන ගීත වර්ථමානයේ පවතින්නේ කුමන තත්ත්වයකද යන්න සොයා බැලීම වේ.

නොයෙක් විද්‍යුත් මාධ්‍යය ශ්‍රී ලාංකීය රසික පිරිස අතරට පැමිණියද තවමත් විද්‍යුත් මාධ්‍ය අතර ජනප්‍රිය මාධ්‍යය බවට පත්ව ඇත්තේ ගුවන් විදුලියයි. ගුවන් විදුලියේ ජනප්‍රියත්වයට හේතු වූ කරුණු කිහිපයක් හදුනාගත හැක. එය ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම ඉන් එකකි. අහන දේ, ඇසෙන දේ විසින් ගෙදර දොරේ වැඩක යෙදී සිටින අතරතුර හෝ ගමනක් යන අතරතුර හෝ වාහනයකදී එළිමහනේදී හෝ ඕනෑම ස්ථානයකදී ගුවන් විදුලියට සවන් දීමට හැකිවී ඇත. ක්ෂණික ග්‍රහණය ඇති කිරීමට ගුවන් විදුලි මාධ්‍යයට ඇති හැකියාව හේතුවෙන් ළමයාගේ සිට වැඩිහිටියා දක්වා ගම - නගර, උගත් - නූගත් භේදයකින් තොරව සමීප වී ඇත. ගුවන් විදුලියට සවන් දීමට සාක්ෂරතා බලපෑම අවම වීම නිසා ඕනෑම අයෙකුට වුවද ගුවන් විදුලිය ප්‍රයෝජනයට ගත හැක.

ඉතා කුඩා ප්‍රමාණයෙන් වුවද යන්ත්‍ර මිලදී ගත හැකි වීමත් පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි වීමත් අනෙක් මාධ්‍යයන්ට සාපේක්ෂව ගුවන් විදුලි යන්ත්‍ර ලාභයට ගත හැකි වීමත් මෙම මාධ්‍යය වඩා රසිකයින් ගොනු වීමට හේතු වී ඇත. ගුවන් විදුලි යන්ත්‍ර සඳහා විදුලි කෝෂ භාවිතා කිරීමට හැකි වීම හේතුවෙන් දුනට විදුලි බලය නොමැති ප්‍රදේශ වල පවා ගුවන් විදුලිය භාවිත කල හැකිය. පුළුල් ග්‍රාහක සමාජයකට එකවර තොරතුරු සම්පාදනය කල හැකි වීමද මෙම මාධ්‍යයේ ප්‍රබලතාවයකි.

මෙවන් ප්‍රබල මාධ්‍යයක් පදනම් කර ගෙන මා විසින් තෝරා ගත් මාතෘකාව වන්නේ "ගුවන් විදුලි එෆ් එම් නාළිකා හරහා සරල ගීතයට සිදුවන බලපෑම" යි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, වෙළඳ සේවය වැනි රජයේ නාලිකා වලට අමතරව වර්ථමානය වන විට විශාල පෞද්ගලික නාලිකා ප්‍රමාණයක් ශ්‍රී ලාංකික ශ්‍රාවකයින්ට ශ්‍රවණය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. මෙම නාලිකා වලින් දවසේ පැය 24 න් අවම වශයෙන් පැය 8ක් වත් ගීත ශ්‍රවණය කිරීමට

හැකියාවක් ඇත. මේ අනුව ගුවන් විදුලි ශ්‍රාවකයාට මෙම ගීත වලින් රසවින්දනයට සෘජු බලපෑමක් සිදුවේ.

"ගීත ඇසීමට මතු නොව ගීත ඉල්ලන්නාගේ නම, හිතවතුන්ගේ සහ පෙම්වතුන්ගේ නම දුරකථන මාර්ගයෙන් කියවා ගැනීමට ලොල් කරන සරල වින්දන පසුබිමක් නිර්මාණය කල පෞද්ගලික ගුවන් විදුලි නාලිකා අධි වේගයෙන් අසන්නා පොළඹවා ගැනීමට මුදල් තෑගී පිරිනැමීමට තරම් පහත් අඩියකට පත් වී ඇත. මෙම සේවාවන්ගෙන් දවසේ පැය 24 න් වැඩි කාලයක් වෙන් වනුයේ ගීත ඉදිරිපත් කිරීමටය. අසන්නාගේ නම්, ගම් පැවසීමට හා අල්ලාප සල්ලාපයේ යෙදීමටය".

*මහින්ද කුමාර දළුපොත*

මෙහිදී ගීත යොදා ගන්නා තාක්‍ෂණය අතින් බලන කල අතීතයට වඩා වර්ථමානය දියුණු මට්ටමක පවතී. නමුත් ගීත වල ගුණාත්මක භාවය, තාක්‍ෂණයේ දියුණුවත් සමග කුමන දිශාවකට ගමන් කරන්නේද යන්න පිළිබද මෙමගින් සොයා බැලිය හැක. එම මාතෘකාව ගත් විට ගුවන් විදුලි නාලිකා වලට වර්ථමානයේ විශාල ප්‍රේක්‍ෂකයින් සංඛ්‍යාවක් සිටීමත් එම නාලිකා මගින් විශාල වශයෙන් ශ්‍රවණය වන්නේ සරල ගිත වීමත් නිසා මේ මාතෘකාව කාලීන වැදගත් කමකින් යුක්ත බැව් හැගේ. මෙම මාතෘකාව පිළිබදව ලියැවුණු පොත් පත් හා පර්යේෂණ නොමැති වීම නිසා මෙම මාතෘකාව පිළිබද පර්යේෂණාත්මක කෘතියක් ඉදිරිපත් කිරීම සමාජ විද්‍යාත්මක වැදගත් කමක් උසුලයි.

## *1.2 ගැටළුව හා උපන්‍යාසය*

පර්යේෂණ ගැටළුව :-

ගුවන් විදුලි එෆ් එම් නාලිකා හරහා සරල ගීතයට බලපෑමක් සිදුවේද?

උපන්‍යාසය :-

ගුවන් විදුලි එෆ් එම් නාලිකා හරහා සරල ගීතයට බලපෑමක් සිදුවේ.